1908 අලුත් ව්‍යවස්ථා පොතේ ප්‍රකාර

හතරවෙනි ප්‍රමාණයේ

# සිංහල ව්‍යාකරණපාත.

කොළඹ විධිවත් ශාස්ත්‍රශාලාවේ පුහුණු
මින්වත්ගොඩ සලවාතේ පඬිත්වි

ඩී. ඇස්. ධර්මසේන ප්‍රේමචන්ද්‍ර

ඇඳුරුතුමාගේ ශිෂ්‍ය කොරලවැල්ලේ
බෞද්ධ මිශ්‍රපාඨශාලාවේ ප්‍රධානාචාර්‍ය්‍යව
විසූවාවූද දැනට දොඩන් දූවේ
බෞද්ධ පිරිමිපාඨශාලාවේ ප්‍රධානාචාර්‍ය්‍යවූ

ටී. ජේ. පීරිස් මහත්මයා විසින්
සම්පාදිතයි.

එච්. හෙන්දිරික් තෝනිස් වන මා විසින්
අච්චුගස්වා ප්‍රසිද්ධ කරණලදී.

ප්‍රසිද්ධ හැදෑරීම් දෙපාර්තමේන්තුවේ
ඩබ්ලිව්. ඇfජ්. ගුණවර්ධන
මුදලි මන්ත්‍රීශ්වරයානන්වහන්සේ විසින්
සාදරයෙන් පිළිගන්නාලදී.

ශිල්පානන්ද යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

1908

*according to the new code of 1908*

# A. Sinhalese Grammar

FOR

**FOURTH STANDARD.**

Dedicated by permission

to

Mudliyar W. F. GUNAWARDANE
of the department of Public instruction
OF CEYLON.
SECRETARY TO THE COMMITLEE
on Oriental Studies Colombo.
Author of the Guttila Kaviya
Warnana and editor of Silumine
&c &c &c.

EDITED BY

**T. J. PEIRIS**

*Dodanduwa Bud Boy School*

Head Master.

PRINTED AT THE
**SILPANANDA PRESS,**
PANADURE

**1908**

# සංඥාපනය.

ස්වභාෂීය පාඨශාලාවල හතරවෙනි ප්‍රමාණයේ උගණීම ලබන ශිෂ්‍යයන්ගේ ප්‍රයෝජනය සඳහා මෙම ව්‍යාකරණ ග්‍රන්ථය කරණ ලදී. 1908 වේ අලුත් ව්‍යවස්ථා පොතේ ප්‍රකාර තත්ප්‍රමාණිකයන්ට පමණක් උවමනා සිංහලම ව්‍යාකරණ රීතීන් අනතිරිකතාකාරයෙන් මෙහි අන්තර්ගතයි.

නමුත් මෙහි මුලට යොදතිබෙන සෝධිය පිළිබඳ ව්‍යාකරණය වනාහි තුන්වෙනි ප්‍රමාණයේ ශිෂ්‍යයන්ට ප්‍රගුණකරන්නොත් හතර වෙනි ප්‍රමාණයේදී වැඩිපහසුව ලැබ විභාග දිනයේදී ඔව්හු විශේෂයෙන් තුෂ්ටිප්‍රාප්ත වෙත් මය. පස්වෙනි ප්‍රමාණයටද මෙසේම ග්‍රන්ථයක් දැනට පිළියෙල කරණු ලැබේ. ශිෂ්‍යයින්ගේ ලේසි වාසිතකා වැදගත් මහතුන් කීප දෙනෙකුගේ අයදුමපිට මෙය කරණ ලද්දක් බැවින් අසමදීයවූ ඉදං ප්‍රයත්නයට සත්ගුණවත් ගුරුවර මහතුන් ප්‍රධාන සාධූන්ගෙන්ද ශෛධාසී ලැබෙතැයි සතුටින් පුලපුලා බලා සිටිමුහ.

මේ ඇර මෙහි ප්‍රමාදදීයෙන් ජනිතවිද්‍යස්ථානයන්හි විද්‍යු සමාධිය භජනායකරන්වා.

තවද මෙය මුද්‍රණය කරවීමේදී අන්තිම පරීක්ෂාපත්‍රාදිය අවලෝකනය කළ දූන් වලාණේ සරණපාලාරාමාධිපතිවූද, පාණදුරේ ශෛලගත විද්‍යාලයේ උපාචාර්ය්‍යවූද, අපාචාර්ය්‍ය වලාණේ ධම්මානන්ද ස්වාමීන්වහන්සේ කෘතඥතාවය ඇඟවීම්වශයෙන් මෙහිදී ස්තුති සහිතව මතක් කරමිහ. එසේම අපේ ලියවිලි ආදියට බොහෝ උපකාර්ව සිටියාවූ කොරලවැල්ලේ බෞද්ධ මිශ්‍ර පාඨශාලාවේ උපගුරුවර ජේ. ඩී. විලියම්මහතාටද ස්තුති කිරීමෙහි ප්‍රසබලිත නොවමු.

මෙම පොතේ අයිතිවාසිකම කතෲවන මටම තබාගත්බව මෙයින් සඳහන් කරමි.

මෙයට,

25-8-08 T. J. Peiris

මොරටුව එගොඩ උයන,

## ලැබුන සහතිකපත්‍ර.

——8(✱)8——

**ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තුවේ පාඨශාලා පරීක්ෂක ජේම්ස් කුරේ මහතා**

කොරල වැල්ලේ බෞද්ධ මිශ්‍රපාඨ ශාලාවේ ප්‍රධාන ගුරුවර ටී. ජේ. පීරිස් මහතා විසින් හතරවෙන් ප්‍රමාණයට කරණලද සිංහල ව්‍යාකරණ පොත මා විසින් කියවා බලන ලදී. මෙය අලුත් ව්‍යවස්ථාවට ඇතුලත් උගතමනා සියලුම ව්‍යාකරණ නීතිවලින් යුක්තය. එබැවින් ස්වභාෂීය පාඨශාලා ශිෂ්‍යයන්ට මෙයින් මහත් ප්‍රයෝජන ඇති වේයයි මම කියමි.

මෙයට

16-8-908. *J. Cooray*

අලුත්ගම්දීය, Sub inspector

## ස හ ති ක ප ත්‍ර.

පවර තෛරුධනිකාචරිය මහාවිහාවිරාජගුරු සුභූති නායකස්ථවිර ස්වාමිපාදයානන් වහන්සේ.

ටී ජේ. පීරිස් සෙකෝල මහත්මයා විසින් විහිත සිංහල ව්‍යාකරණය නම් ග්‍රන්ථය මා විසින් මදක්දුර කියවා බලන ලද්දේය. එය සිංහල පාඨශාලාවල පුහුණුකිරීමට සෑහෙන පොතක්බව වැඩිදුරටම වැටහුනේය.

16-8-08 මෙවනට,

වස්කඩුවෙදීය. W. Subuhti

රාජකීය ආසියාතික සමිතියේ හා ප්‍රාචීන භාෂොපකාර සමිතියෙත් සාමාජිකවූ පාණදුරේ ඩී. ඇම. ඇස්. කවිරාජ පඬිතුමා.

මෙනම් සෛංහලීය ව්‍යාකරණ ග්‍රන්ථය යථාවසරයෙන් අවලොකනය කෙලෙමු. ශ්‍රන්ථ ග්‍රන්ථිතාකාරය විචිත්‍රයි. ව්‍යක්ති ක්‍රමාකාරය ව්‍යක්ත ජනමනඃ ප්‍රසාදයට අනඟාය සහෙතුක හෙතුවෙකැ. ඉදං කාලික සෛංහල පාඨශාලීය ශිෂ්‍යයන්ගේ උද්ග්‍රහණ ධාරණ පරිශීලනයට අතිශයොචිත හෙයින් ග්‍රන්ථ කාරක ටී. ජේ. පීරිස් මහත්මා හට අසමදීයාදර සතුතිය පරිනාමිත කරම්හ.

ප්‍රිය ප්‍රණයී

14-8-08 D. M. Silva.

පාණදුරේදීය.

# සිංහල ව්‍යාකරණ.

ව්‍යාකරණ නම් භාෂාවක් යෝග්‍ය පරිද්දෙන් ලියන්ට කියන්ට උගන්වන්නාවූ ශාස්ත්‍රයයි. ඊයේරාත්‍රියේ තදින් වරුසා වැස්සෙමි; කුකුළාට මරාපන්; හරක් සොයන්ට ළමයාව අරපන්; මම විසින් පොත ලිවෙමි; කඩේ කෑමට බඩු ගන්ට අපිගියා; මේ ව්‍යාකරණ විධියට ආකූලවූ වාක්‍යයොත්. එහි අක්ෂර ව්‍යවහාරයේද, ක්‍රියා යෙදීමේද, විභක්ති යෙදීමේද, ඇසීමෙන් වැරදි හැඟීමට තිබෙන දෝෂද යනාදි දෝෂ විද්‍යමානවේ. එබැවින් සංඥා, සංධි, ලිඞ්ග, විභක්ති, සමාස, ප්‍රකෘති, ප්‍රත්‍ය, ක්‍රියා, ලෝප, ආදේශ, ආගම, පූර්වරූප, විත්වරූප, විපර්‍යාස, වෘද්ධිය, හානිය, නිපාතය, නියම විධිය, අනියම් විධිය, අවිද්‍යමාන විධිය, යන ව්‍යාකරණ විධි විස්ත මෙම ශාස්ත්‍රය අවබෝධකරන්නන් විසින් මනාව උගතයුතුය.

## හෝ ඩි ය.

සිතෙහි හටගන්න අදහස් අප විසින් කීමෙන් හෝ ලිවීමෙන් අන්‍යයන්ට ප්‍රකාශ කරණු ලැබේ. ඒ කියන හෝ ලියන ඒවාට අප විසින් වචන කියාද, ශබ්ද කියාද, පද කියාද කියනුලැබේ. වචන හෙවත් පද කිපයකින් යුක්තවූයේ වාක්‍ය නම්වේ. මේ වාක්‍ය ලිවීමෙන් අන්‍යයන්ට හැඟවීම පිණිස ඒ ඒ රටවල අය විසින් රූප ඇඳගන තිබේ. මේ රූපයන්ට අක්ෂර හෙවත් වර්ණයෝ යයි කියනුලැබේ.

ඒ අක්ෂරයන්ගේ පිළිවෙලට හෝඩිය යයි ව්‍යව හාර කරති.

## දැනට ව්‍යවහාරකරණ හෝඩියේ අක්ෂර.

අ ආ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ එ ඓ ඔ ඖ
අ (ං) අ (ඃ)

ක ඛ ග ඝ ඞ ච ඡ ජ ඣ ඤ ට ඨ ඩ ඪ ණ
ත ථ ද ධ න ප ඵ බ භ ම ය ර ල ව ශ ෂ ස හ ළ

මෙහි " අ ,, යන්න පටන් " ඖ ,, යන්න කෙළවරකොට ඇති අක්ෂර ස්වර හෙවත් ප්‍රාණාක්ෂර ( පණකුරු ) නම්වෙති. *

"ක" යන්න පටන් " ළ ,, යන්න කෙළවර කොට ඇති අක්ෂරයෝද, අනුස්වාරය නම්වූ බින්දුව ( ං ) ද විසර්ගය නම්වූ බින්දුදෙක ( ඃ ) ද, ව්‍යඤ්ජන හෙවත් ගාත්‍රාක්ෂර ( ගතකුරු ) නම්වෙති,

## ස්වර විභාග

ස්වරයෝ නම් තනි තනිව ශබ්ද කරන්ට පුළුවන් හෙවත් ව්‍යක්ත ශබ්ද උපදවන අකුරුය. ඉහතකී ස්වරයෝ හ්‍රස්ව, දීර්ඝ, නොහොත් ලඝු ගුරු,, යයි විවිධ වෙත්. ඇදීලා නොකියවෙන අක්ෂර වලට හ්‍රස්ව කියාද ඇදීලා කියවෙන අක්ෂරවලට දීර්ඝයකියාද, කියනුලැබේ. අ ඉ උ ඍ ඏ මේ හ්‍රස්වාක්ෂර වේ. ආ ඊ ඌ ඎ ඐ එ ඓ ඔ ඖ මේ දීර්ඝාක්ෂරවේ.

---

* ඇ ඈ දෙක අ ආ දෙකේ මාත්‍රංශයක කියාද, ඒ ඕ දෙක එ ඔ දෙකේ දීර්ඝ ඉසිලීමය කියාද සලකනලදී.

තවත් හ්‍රස්ව දීර්ඝයන්ගේ විශේෂ විභාගයක්
මෙසේ දතයුතු ඒක මාත්‍රාවක් ඇත්තේ හ්‍රස්වද
ද්විමාත්‍රාවක් ඇත්තේ දීර්ඝද, තුන්මාත්‍රාවක් ඇත්
තේ ප්ලුතද (අර්ධමාත්‍රාවක් ඇත්තේ ව්‍යඤ්ජනද)
කියාය

මාත්‍රාව නම් ඇසිපියක් හෙලන පමණ
ඇදිලා කියවෙන කාලයවේ. කලඳ්රිත්තා නම්
සතා එක්මාත්‍රයක්ද, කවුඩා මාත්‍රවයක්ද මො
නර මාත්‍රා තුනක්ද මුගටියා අර්ධමාත්‍රයක්ද ශබ්ද
කෙරෙයි කුකුලාගේ හැඬලීම් ශබ්දයෙහි හ්‍රස්ව
දීර්ඝ ප්ලුත යන තුන් කාලයම විද්‍යමානවේ.

## ව්‍යඤ්ජන විභාග

ව්‍යඤ්ජනාක්ෂර නම් තනියම ශබ්ද කරන්ට
අප්‍රාපුවන් හල් අකුරුයි උදාහරණ:- ක් ග් ජ් ත්
ඩ් යන මොහු වෙත්. මේවා ශබ්ද වෙන්නේ
හෙවත් නිසිසේ කියවෙන්නේ ප්‍රාණාක්ෂරයන්
ඒතුලට වැටීමෙන්ය. මල සත්වයෙකුට ප්‍රාණය
ලැබීම සතාගේ අතපය(ගාත්‍රා) හොලවන්නේ
යම්සේද එසේ මේ ගාත්‍රාක්ෂර ප්‍රාණාක්ෂරයන්
ඇසුරුකිරීමෙන් ව්‍යක්ත ශබ්ද උපද වන බව
දතයුතු.

ව්‍යඤ්ජනාක්ෂර ක වර්ගය, ච වර්ගය, ට වර්ගය,
ත වර්ගය, ප වර්ගය, යයි වර්ග පසකටද අන්තඃ
ස්ථ, ඌෂ්ම යන දෙකොටසකටද බෙදනලද්දේය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ක | ඛ | ග | ඝ | ඞ | යන පස | කවර්ග නම් වේ |
| ච | ඡ | ජ | ඣ | ඤ | | චවර්ග නම් වේ |
| ට | ඨ | ඩ | ඪ | ණ | | ටවර්ග නම් වේ |
| ත | ථ | ද | ධ | න | ,, | තවර්ග නම් වේ |
| ප | ඵ | බ | භ | ම | ,, | පවර්ග නම් වේ |
| ය | ර | ල | ව | | යන සතර | අන්තඃස්ථ නම්වේ |
| ශ | ෂ | ස | හ | | ,, | ඌෂ්ම නම් වේ |

මහාප්‍රාණ අල්ප ප්‍රාණ නියා මේ අක්ෂර දෙයාකාර වෙත් ඛ ඝ ඡ ඣ ඨ ඪ ථ ධ ඵ භ ශ ෂ ස හ මහා ප්‍රාණ නම්වේ.

ක ග ඞ ච ජ ඤ ට ඩ ණ ත ද න ප බ ම ය ර ල ව අල්ප ප්‍රාණ නම් වේ.

ගාත්‍යාක්ෂරයෝ ඝෝෂා ඝෝෂ"යයි දෙකොට සකට බෙදන ලද්ද එනම්, වර්ග්‍යන්ගේ පළමුවන දෙවන අකුරුද ශ ෂ ස යන තුනද, විසර්ජනීයද, අඝෝෂා ක්ෂරයෝ වෙති සෙස්සෝ ඝෝෂාක්ෂරයෝ වෙති.

## අකුරු උපදින ස්ථාන.

අක්ෂරයෝ නානා ස්ථානවලින් උපදිත් එනම් කවර්ගීයද අ ආ හ (අ) ඃ යන සතරද උගුරෙන් උපදිති, එබැවින් ඔව්හු කණ්ඨජ නම්වෙත්

චවර්ගී යද ඉ ඊ ය ශ යන සතරද තල්ලෙහි උපදිති එබැවින් ඔව්හු තාලුජ නම් වෙත්.

ට වර්ගීය යද ඍ ඎ ර ෂ ළ යන පසද මුඳුනෙහි උපදිති. එබැවින් ඔව්හු මූර්ධජ නම්වෙත්

තවර්ගී ද ඏ ඐ ල ස යන සත සතරද දත්වල උපදිති. එබැවින් ඔව්හු දන්තජ නම් වෙත්

පවර්ගීය ද උ ඌ යන දෙකද තොල්වල උපදිති එබැවින් ඔව්හු ඔෂ්ඨජ නම් වෙත්.

එ ඓ දෙක උගුරෙහිද තල්ලෙහිද උපදිති, ඔව්හු කණ්ඨ තාලුජ නම්වේ.

ඔ ඖ දෙක උගුරෙහිද තොල්වලද උපදිති එබැවින් ඔව්හු කණ්ඨෞෂ්ඨජ නම්වේ.

ව යන්න දත්හිද තොල් හිද උපදී එබැවින් එය දන්තෝෂ්ඨජ නම් වේ.

ඞ ඤ ණ න ම යන වර්ගාන්ත පස ඉහත කී ස්ථානවලද නාසිකාවෙහිද උපදින හෙයින් අනුනාසිකාක්ෂර යයි කියනුලැබේ.

අනුස්වාරය නම් ( ං ) බින්දුවද නාසිකාවෙහි උපදී ඊට අනුස්වාර නම්වූයේ එය නිතරම ස්වරය කට පසුව සිටිනා බැවිනි

### අකුරු ඉපදීමට කරණ හෙවත් උපකාර වන ස්ථාන.

ඉ ඊ ච ජ ඣ ඤ ය ශ යන තල්ලේ උපදින අකුරුවලට දිව මැද කරණයි.

ඍ ඎ ට ඨ ඩ ඪ ණ ර ෂ ළ යන මුදුනේ උපදින අකුරු වලට දිව අග ලඟ කරණයි.

ඏ ඐ ත ථ ද ධ න ල ස යන දත්වල උපදින අකුරවලට දිව අග කරණයි.

ඉතිරි සියළු අකුරුවලට ඒ ඒ අකුරු උපදින තැන්ම කරණවෙත්.

### ගාත්‍රාක්ෂරයන්ට ස්වර ආරූඪ වන පරිදි.

| | |
|---|---|
| ක් + අ = ක | ක් + ඏ = කෟ |
| ක් + ආ = කා | ක් + ඐ = කෳ |
| ක් + ඉ = කි | ක් + එ = කෙ |
| ක් + ඊ = කී | ක් + ඓ = කෛ |
| ක් + උ = කු | ක් + ඔ = කො |
| ක් + ඌ = කූ | ක් + ඕ = කෝ |
| ක් + ඍ = කෘ | ක් + අං = කං |
| ක් + ඎ = කෲ | ක් + අඃ = කඃ |

ග් + අ = ග
ග් + ආ = ගා
ග් + ඉ = ගි
ග් + ඊ = ගී
ග් + උ = ගු
ග් + ඌ = ගූ
ග් + ඍ = ගෘ
ග් + ඎ = ගෲ
ජ් + අ = ජ
ජ් + ආ = ජා
ජ් + ඉ = ජි
ජ් + ඊ = ජී
ජ් + උ = ජු
ජ් + ඌ = ජූ
ජ් + ඍ = ජෘ
ජ් + ඎ = ජෲ
ජ් + ඏ = ජෟ
ජ් + ඐ = ජෳ
ජ් + එ = ජෙ
ජ් + ඓ = ජෛ
ජ් + ඔ = ජො
ජ් + ඕ = ජෝ
ජ් + අං = ජං
ජ් + අඃ = ජඃ

ග් + ඏ = ගෟ
ග් + ඐ = ගෳ
ග් + එ = ගෙ
ග් + ඓ = ගෛ
ග් + ඔ = ගො
ග් + ඕ = ගෝ
ග් + අං = ගං
ග් + අඃ = ගඃ
ත් + අ = ත
ත් + ආ = තා
ත් + ඉ = ති
ත් + ඊ = තී
ත් + උ = තු
ත් + ඌ = තූ
ත් + ඍ = තෘ
ත් + ඎ = තෲ
ත් + ඏ = තෟ
ත් + ඐ = තෳ
ත් + එ = තෙ
ත් + ඓ = තෛ
ත් + ඔ = තො
ත් + ඕ = තෝ
ත් + අං = තං
ත් + අඃ = තඃ

## පදයන්ගේ ප්‍රාණාක්ෂර ගාත්‍රාක්ෂර වෙන්කරණ පදිවි

| එගොඩලයන | මොරටුව | දුටුගැමුණුරජ |
|---|---|---|
| ……… එ = එ | ම් + ඔ = මො | ද් + උ = දු |
| ග් + ඔ = ගො | ර් + අ = ර | ට් + උ = ටු |
| ඩ් + අ = ඩ | ට් + උ = ටු | ග් + ඇ = ගැ |
| ……… උ = උ | ව් + අ = ව | ම් + උ = මු |
| ය් + අ = ය | | ණ් + උ = ණු |
| න් + අ = න | | ර් + අ = ර |
| | | ජ් + අ = ජ |

| වසතුනණිහාව | මනුෂ්‍යයෝ |
|---|---|
| ව් + අ = ව | ම් + අ = ම |
| ස් + , = ස් | න් + උ = නු |
| ත් + උ = තු | ෂ් ය් + අ = ෂ්‍ය |
| න් + අ = න | ය් + ඕ = යෝ |
| ණ් + ,, = ණ් | |
| හ් + ආ = හා | |
| ව් + අ = ව | |

## ගාත්‍රාක්ෂර රූඪවූ ප්‍රාණාක්ෂරයන් වෙනුවට යොදන සලකුණු.

| ප්‍රාණාක්ෂරය | සලකුණ | කියනනාමය |
|---|---|---|
| ආ | ා | ඇලපිල්ල |
| ඉ | ි | ඉස්පිල්ල |
| උ | ු හෝ ු | පාපිල්ල |
| ඌ | ූ හෝ ූ | දීඝපාපිල්ල |
| ඍ | ෘ | ඇලපිල්ල සහ ගැටය |
| ඎ | ෲ | ඇලපිලිදෙක සහ |
| ඏ | ෟ | ගයනුකිත්ත(ගැටදෙක |
| ඐ | ෳ | ගයනුකිත්ත සහ ගැටය |

| | | |
|---|---|---|
| එ | ෙ | කොම්බුව |
| ඓ | ෛ | කොම්බුදෙක |
| ඔ | ො | කොම්බුවසහඇලපිල්ල |
| ඕ | ෝ | කොම්බුවසහගයනුකිත්ත |
| ඍ | ෘ | ගුරුව මාත්‍රාංශය |
| ඎ | ෲ | දීඝ මාත්‍රාංශය |

## සංයෝග වර්ණ.

යම් ස්වර රහිත ගාත්‍රාක්ෂරයක් ඉදිරියෙහි ගාත්‍රාක්ෂරයක් හා බැඳේද ඒ සංයෝග නම්වේ සංයෝග වර්ණ ලිවීමේදී බොහෝ සෙයින් ඒ අකුරු දෙකින් එකක අංශයක් පමණක් දක්නාලැබේ.

## උදාහරණ.

| | |
|---|---|
| ක්+ව-ක්ව | ක්+ර=ක්‍ර |
| ක්+ෂ-ක්ෂ | ර්+ම-ර්‍ම |
| ග්+ධ-ග්ධ | ඞ්+ග-ඟ |
| ජ්+ඤ-ඥ | ඤ+ච-ඤ්ච |
| ට+ඨ-ට්ඨ | ඤ්+ජ-ඦ |
| ත්+ථ-ත්ථ | ණ+ඩ-ඬ |
| ද්+ව-ද්ව | ම+බ-ඹ |
| ක්+ය-ක්‍ය | |

හල් අකුරකින් පරවබැඳෙන යකාරයේ සලකුණ(්‍ය)යංශ නම්වේ. හල් අකුරකින් පරව බැඳෙන රකාරයේ සලකුණ (්‍ර) රකාරාංශ නම්වේ. ස්වර සහිත ව්‍යඤ්ජනයකින් පූර්වයෙහි සිටිනහල්රකාරයේ සලකුණ (ර්‍) රේඵ නම්වේ.

## භාෂාවේ මිශ්‍ර හා අමිශ්‍ර භෙදය.

සිංහල භාෂාව මිශ්‍රසිංහලය අමිශ්‍ර සිංහලය කියා දෙවැදෑරුම්ය, මාගධ, සංස්කෘත, දෙමළ පෘතුගීසි, ඉංග්‍රීසි, යනාදී භාෂාංවන්ගේ වචන හා මිශ්‍රවූ භාෂාව මිශ්‍රසිංහල නම්වේ. අන්‍යකිසි භාෂාවක් හා මිශ්‍රනුවූ භාෂාව අමිශ්‍ර සිංහල හෙවත් ශුද්ධ සිංහල නම්වේ. මීට එළුව යසිද ව්‍යවහාරයි *

අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ ක ග ජ ට ඩ ණ
ත ද න ප බ ම ය ර ල ව ස හ ළ අං

මේ ශුද්ධ සිංහල භාෂා හෝඩියේ අක්ෂරයෝ වෙත්. සංස්කෘතාදී භාෂාවන්ගේ අක්ෂරද මේ හෝඩියට එකතුවීමෙන් දැනට ව්‍යවහාර සිංහල හෝඩිය සෑදීතිබේ. සඟරා ප්‍රවෘත්ති පත්‍රද වාසගම් පොත්ද කථාව්‍යවහාරයද මිශ්‍ර සිංහල භාෂාවෙන් කරති. කාව්‍ය බන්ධනය, අමිශ්‍ර සිංහල භාෂාවෙන් කරති. සිංහල භාෂාවට මාගධික වචන මිශ්‍රවීමට ප්‍රධානහේතුවූයේ සිංහලජනයා බෞද්ධාගම වැලඳගැණීමය. වෛද්‍යශාස්ත්‍රාදී සංස්කෘත භාෂාවෙන් ලියනලද පොත් සිංහල

* ශුද්ධ සිංහල හෙවත් එළුවයයි ව්‍යවහාරකරණ භාෂාවේද, පාලි සංස්කෘත භාෂාවලද තත්භව තත්සම වශයෙන් එන ධාතු, ශබ්ද, ප්‍රත්‍යය ඇතිවේ. එසේ පැමිණීමට මිශ්‍ර වීමයයි නොකියති. මෙහි මිශ්‍රවීමයයි කියනු ලැබුවේ ඍ ඎ ඏ ඐ ඓ ඖ ඛ ඝ ඞ ච ඡ ඣ ඤ ඵ භ ශ ෂ යන පාලි සංස්කෘත අක්ෂරයන් රඳන වචන හා මිශ්‍ර කොට කරණ භාෂාව ගැනය

ජනයා අවබෝධකිරීම කරණකොට සංස්කෘත
වචනාද එකතුවිය. දෙමල පෘතුගීසි ඉංග්‍රීසි ආ
දීන්ගේ ආශ්‍රය නිසා ඒ ඒ භාෂාවල වචනාද
සිංහල භාෂාවට එකතුවිය. අමිශ්‍ර සිංහල භා
ෂාවට වඩා මිශ්‍ර සිංහල භාෂාව සුඛාවබෝධය.

## පද භේදය.

අර්ථවත් අකුරු සමූහය පද නම් වේ. වාක්‍ය
සැදෙන්නාවූ පදසතර ආකාරති. එනම්, නාම,
ක්‍රියා හෙවත් ආඛ්‍යාත, නිපාත සහ උපසර්ග
යනා මොහුය.

නාම පද නම්, සත්වයන්ට හෝ ද්‍රව්‍යයන්ට
කියන නාමය.

උදාහරණ:-මිනිසා, ගොණා, දෙමලා, දුවන්
නා, බබාණ්ස්, පුටුව, රට, කුඩය, රතු. මම, ඒ,
සැඩිම, යනාදියවේ.

සියල්ලන්ටම ව්‍යවහාර කරන හැකිනාම,
සර්වනාම පදයි.

උදාහරණ:-ඒ, මේ. තෝ, මම, හැම, සියලු
අන්, අන්ක්. ඇම්, පෙර, පර, කවර, යනාදියයි.

සමාස නාම ප්‍රත්‍යයාර්ථනාම කියා නාම පද
නොයෙක් භෙද ඇතිවේ.

විභක්ති ආශ්‍රයකරන්ට පෙර නාමයන්ට ශබ්ද
යයි කියනුලැබේ. ජාතිශබ්ද, ද්‍රව්‍යශබ්ද, ගුණ
ශබ්ද, සංඥාශබ්ද, ක්‍රියා ශබ්ද කියා පංචප්‍රභෙ
දයකටද, අනිර්ථය, අරුණය, කියා දෙයාකාරය
කටද, නාමයේ අගාවෙනස්කිරීමෙන්සහ වාක්‍ය
වල ගැලපීමේ අනුමින් සාදන ප්‍රථමා කර්ම,
කර්තෘ, කරණ, සම්ප්‍රධාන, අවධි, සම්බන්ධ අධා

ආලපන, යන නව ආකාර විභක්ති වලටද්, වෙනස් වෙනස් ප්‍රභේද ඇතිකරවන්නේත් නාමපද නම්වේ.

**ක්‍රියා පදනම්.** යමෙකුගේ කිරීමක් විඳීමක්, වීමක් ආදිය හඟවන පදයි. උදාහරණ:-මැරුවේය, විඳිති, කරන්නෙමි, රකිම්වා සිටුව, හඬවම්, යතොත්, ගොසින්, බලමින්, බැබළේ, යනාදියවේ.

ධාතුවත් ප්‍රත්‍යයත් එක්වීමෙන් ක්‍රියා පදය සෑදේ. ක්‍රියාවේ මුල් සවභාවට ධාතුව කියාද, අගින් කියවෙන අකුරක් හෝ දෙකකට ප්‍රත්‍ය කියාද කියනු ලැබේ. මේ ධාතු සකර්මකය, අකර්මකය, කියා දෙවැදෑරුම්ය. ක්‍රියාවක අතීත, වර්තමාන, අනාගත, යනකාලත්‍රතාද, අන්‍ය කාරක, හ ශබ්ද කාරක, ම ශබ්ද කාරක යනකාරකත්‍රතාද, ප්‍රකටකව තිබේ. ධාතු අගින් ඒ ඒ කාලවලට හා පුරුෂ වලටත් යෝග්‍යවූ ප්‍රත්‍ය වැටීමෙන් ක්‍රියා පදවල නානා අර්ථ හඟවනු ලැබේ.

තවත් මේ ක්‍රියාකතෘ කාරක ක්‍රියාය, කර්මකාරක ක්‍රියාය, විධික්‍රියාය, ආශීර්වාද ක්‍රියාය, ප්‍රයෝජ්‍ය ක්‍රියාය, අසම්භාවන ක්‍රියාය, පූර්වක්‍රියාය, මිශ්‍රක්‍රියාය, කියා නානාවිධවේ. *

**නිපාත පද** නම් නාමපදයක් ක්‍රියා පදයක් නොවන්නාවූ වක්‍ය සම්පූර්ණ කිරීම් ආදිය

---

* මෙහි අර්ථක්‍රියාව සහ භාවක්‍රියාව නාමපද වශයෙන් සලකනලදී.

පිණිස වාක්‍යවල මුලින් මැදින් අගින් ඇති වෙන පදයි. නානාවිධ නානාර්ථ ප්‍රකාශකරණ නිපාත ඇතිවේ. උදාහරණ:-සහ, අනේ, කොල, නො, ද, විනා, හොහොත්, සේ, නැවත දක්වා ලූ, ම, විසින්, තෙම, තොමෝ, තුමූ, හැර, යනාදියයි.

තෙම, තොමෝ, තුමූ, යන නිපාත නාම පද වශයෙන්ද දක්වා හැර යනාදී නිපාතයෝ පූර්ව ක්‍රියා වශයෙන්ද තිබිච්චක සලකත්.

උපසර්ගපද; නාම පදවල සහ ක්‍රියා පදවල අර්ථය අලඞ්කාරකිරීමට හෝ බාධාකිරීමට එහි මුලට දමන අකුරක් හෝ දෙකක්ය. උපසර්ග නියමවශයෙන් ප, පර, අව, ස, අනු, නි, දු, වි, අ, අදි, සු, උ, අභි, පිරි, උප, අප, පස්, පිළි, අති, පි, කියා විස්සක්වේ.

උදාහරණ:-ප,මණ; ස,බඳ; දු,ලබ; අ,දර; සු,සිරි; උප,ගුරු; පිළි,ගණී; අනු,රූප; යනාදියයි.

නිපාත උපසර්ගවලට ලිඞ්ගභේදයක් හෝ සංඛ්‍යාභේදයක් නොපෙනේ. එබැවින් මීට අව්‍යපදයයි ව්‍යවහාරයි. *

## ලිඞ්ග භේදය.

ලිඞ්ග:-මෙහි අර්ථසලකන කල සැඟවුනු අඞ්ගය යන අර්ථයක් විද්‍යමානවේ.

පුරුෂයින්ට හෙවත් පිරිමි සතුන්ට කියන නම් පුරුෂ ලිඟුයි. ස්ත්‍රීන්ට හෙවත් ගැණු

---

* සමහර අව්‍යශබ්ද කෙනෙක් ලිඟුවත්වද පෙණේ, ශේ කුපුරිස් ආදියයි.

සතුන්ට කියන නම් ස්ත්‍රී ලිඟුයි. හිත් පිත් නැති දේට හෙවත් අප්‍රාණික දේට කියන නම් නපුංසක ලිඟුයි. මෙසේ සංස්කෘත මාගධී භාෂාවන්හි නාම ලිඞ්ග තුනකට බෙදේ. නමුත් සිංහල භාෂාවේ පුරුෂ ස්ත්‍රී ලිඞ්ග දෙකහැර විශේෂ විභාගයක් නොපෙණේ.

සකුසත් අනුසෙරෙන් ඇතදසදනට ලිඟුබේ නොපැනේ එහර වෙසෙසෙක් පුම ඉතිරි ලිඟු දෙකවි නා,; මේ ලිඞ්ගභේදයගැණ සිදත්සඟරාකර්තෘගේ මතයි. සංස්කෘත මාගධී භාෂාවන්හි නපුංසක ලිඞ්ගයෙහි වන්නාවූ බොහෝ නාම සිංහලට නැගී එනකල පුරුෂ ලිඞ්ගයෙහි වැටේ. *

පුරුෂ ලිඞ්ගයට උදාහරණ. රජ, දාසයා, ගොණා, දුවන්නා, සතුරා, යකා, පියා, ගුරුලා, මාමා, නුවරකණා, මුව, සිප් යනාදියයි

ස්ත්‍රී ලිඞ්ගයට උදාහරණ:-බිසව, දාසි, දෙන, දුවන්නී, සැතිරී, යකිනී, මව්, ගුරුළු මෙනෙවි, නැන්දා, නැව, ගඞ්ගාව, යනාදියයි.

සංස්කෘත භාෂාවේ නපුංසක ලිඞ්ගයෙහිවූ සිංහල භාෂාවෙහි පුරුෂලිඞ්ගයෙහි වන නාම වලට උදාහරණ:-

---

* මෙසේ මුත් සංස්කෘත භාෂාවෙහි මිත්‍ර ශබ්ද දිය නපුංසක ලිඟු ව්‍යවහාරයට අතුලත්වේ. මාගධීභාෂාවෙහි ස්ත්‍රීන්ට ව්‍යවහාරවූ මාතුගාම ශබ්දදීය පුරුෂ ලිඟුඇත්තේවේ.

අරන්, උයන්, තණ, නුවර, මුව, සිජ්, දත තොත්, පව්, පත් මස්, සුව, ගඳ, යනාමෙය.

සර්වනාමපදද ගුණශබ්දද මේ ලිඞ්ගත්‍රනාම භජනයකෙරේ, නිපාත උපසර්ගී පදයන්ගේ ලිඞ්ග භෙදය නොමැත්තේය. අපරක්‍රියාද ලිඞ්ගභජනය නොකරේ

පුරුෂ ලිඞ්ගශබ්දයන් ස්ත්‍රී අර්ථයක් ප්‍රකාශ කරන්ට උවමනා කල්හි හෙවත් ස්ත්‍රී ලිඞ්ගයෙහි වන කල්හි පදයේ අගින් ඊ, ඉනි යන්නාක ශබ්දයහෙවත් ඊ, ඉනි ප්‍රත්‍යලියනුලැබේ.

උදුහරණ.

| "ඊ" ප්‍රත්‍ය | | "ඉනි" ප්‍රත්‍ය | |
|---|---|---|---|
| කුමරු, | කුමරී | යකා, | යකිනී |
| දාසයා, | දාසී | රජා, | රජිනී |
| එත්තා, | එත්නී | භික්ෂු, | භික්ෂුනී |
| රක්ෂයා, | රාක්ෂසී | නා, | නැයිනී |
| ශූද්‍ර, | ශූද්‍රී | ඇතා, | ඇතිනී |

යම් කිසි ශබ්ද යන්ට ස්ත්‍රී ප්‍රත්‍යඑකතුකරණු නොලැබේ. ඒ ශබ්දයන්ගේ ස්ත්‍රී අර්ථය, අන් ශබ්දයකින් දෙනුලැබේ.

උදාහරණ.

| | |
|---|---|
| මයිල් , | නැන්දා |
| රජ , | බිසව |
| පුත් , | දූ |
| අස් , | වෙළඹ |
| සැමි , | අඹු |
| ගොන් , | දෙන |

## සංඛ්‍යා භේදය

එකදෙයක් හෝ එක සතෙක් හඟවන ශබ්ද ඒකවචන ශබ්ද හෙවත් එක බසේ ශබ්ද යයි කියනුලැබේ.

උදාහරණ:-අඹේ, වත්ත, රට, මොනරා, මිනිසා, එළුවා. මේ ශබ්ද ඒකවචනයි.

අඹේ කීවිට එක අඹයක් බව හැඟෙ. වත්ත කීවිට එක වත්තක් බවත් හැඟේ මෙසේ එක සංඛ්‍යාවක් ප්‍රකාශකරණ ශබ්ද ඒක වචනයයි දතයුතුයි.

එක දෙයකට හෝ එක්සත්වයෙකුට වැඩිගණනක් හඟවා නම් එය බහුබස හෙවත් බහුවචන ශබ්දයයි කියනුලැබේ. ඒක වචන ශබ්දයන්ගේ අග වෙනස්කිරීමෙන් බහු වචන ශබ්ද සාදාගත හැකිය. ඒ වෙනස්කිරීම පිණිස ශබ්දයේ අග බොහෝ කොට යෙදෙන ප්‍රත්‍යයෝ නම් අ උ ඉ ඔ වල් හු ලා වර යන මේවා වෙත්.

සමහර අචේතනක ශබ්ද ප්‍රකෘතිය ස්වභාවයෙන් බහු වචනයෙන් පිහිටාතිබේ.

උදාහරණ වී, වැලි, ගිනි, දිය, කොස්, වැල්, ගස්, යනාදියයි

උදාහරණ.

| ශබ්ද ප්‍රකෘතිය: | එහි ඒක වචනය: | එහි බහු වචනය. |
| --- | --- | --- |
| රට | රට | රටවල් |
| මොනර | මොනරා | මොනරු |
| මිනිස් | මිනිසා | මිනිස්සු, මිනිස්සුහු |
| එළු | එළුවා | එළුවෝ |

| | | |
|---|---|---|
| අඹ | අඹේ, අඹය | අඹ |
| වතු | වත්ත | වතු |
| සතුරු | සතුරා | සතුරෝ |
| දෙබර | දෙබරා | දෙබරු |
| අම්මා | අම්මා | අම්මාලා, අම්මාවරු |
| අඟු | අඟුව | අඟුවෝ |
| ලඳ | ලඳ | ලන්දු |
| හරක් | හරකා | හරක් |
| මුහුද | මුහුද | මුහුදු |
| නයි | නයා | නයි |
| ම | මම | අපි |
| තා | තා | තොපි |
| මාමා | මාමා | මාමාලා |
| ගෙ | ගෙය | ගෙවල් |
| පාර | පාර | පාරවල් |
| කැලෑ | කැලෑව | කැලෑවල් |
| ගල් | ගල | ගල් |
| පුටු | පුටුව | පුටු |
| වීදුරු | වීදුරුව | වීදුරු |
| ආප්ප | ආප්පය | ආප්ප |
| ගුරු | ගුරුවරයා | ගුරුවරයෝ, ගුරුවරු |
| සිටු | සිටුවරයා | සිටුවරයෝ සිටුවරු |
| තරඳි | තරඳිය | තරඳි |
| තුඹ | තුඹ | තුඹලා |
| ගිනි | ගිනි | ගිනි |
| කොස් | කොස් | කොස් |
| ගෙඩි | ගෙඩිය | ගෙඩි |
| වැලි | වැලි | වැලි |

## ශබ්දයන්ගේ භෙද පස හා භෙද දෙක.

ශබ්ද ප්‍රකෘතීනට අයිතිවූ නාමය ජාතිශබ්දය, ද්‍රව්‍යශබ්දය, ගුණශබ්දය, ක්‍රියා ශබ්දය, සංඥා ශබ්දයයි පඤ්චප්‍රකාරයකට බෙදේ. යලිත් අන්වර්ථ ශබ්දය අරූඪ ශබ්දයයි ද්විප්‍රකාරයකටද බෙදේ.

ඉපදීමෙන් ලැබෙන නාමය ජාති ශබ්ද නම් වේ. උදාහරණ:- මිනිස්, දෙමළ, බලු, ආදියයි.

ගල්, දඬු, ආදි ද්‍රව්‍යයකට ව්‍යවහාර නාමය ද්‍රව්‍ය ශබ්ද නම් වේ. මෙය සුදු, කළු, ආදිගුණ යන්ට ආධාරව පවත්නේය. උදාහරණ:-පොත්, කල. ගල්, ජල, ආදියයි,

සුදු, කළු, ආදි ගුණයක් ප්‍රකාශ කරණ නාමය ගුණශබ්ද නම්වේ. මෙය ද්‍රව්‍යයන් ආශ්‍රය කරණ ස්වභාව ඇත්තේය උදාහරණ:-රතු, උස්, නිල්, මිහිරි; ආදියයි.

යාම් ඊම් ආදි ක්‍රියාවක් කියන නාමය ක්‍රියා ශබ්ද නම්වේ. මෙය අර්ථ ක්‍රියාය, භාව ක්‍රියාය කියා දෙවදෑරුම්ය. උදාහරණ:-යන්නා; දුවන්නා, බැඳුනේ, නටනු, වයනු, ආදියයි.

යමෙක් හෝ යමක් ඒ සමාන අනික් වස්තූන් ගෙන් වෙන්කරගැණීමපිණිස දෙනලද නාමය සංඥා ශබ්ද නම්වේ. උදාහරණ:-බබානිස්, රත්නා, ගම්පල; ටොම්, සිකුරාද යනාදියයි.

අර්ථයට අනුව වැටුන නාමය, හෙවත් අර්ථය අනුව යන නාමය අන්වර්ථ ශබ්ද නම්වේ. උදාහරණ:-මියුලැසි, දූවා, දිනිඳු, ශ්‍රීගිරි, යනාදියයි

අර්ථ කල්පනාවකට නැත්ත වූ හෝ හැඟෙන අර්ථයට විරුද්ධ ලෙස ව්‍යවහාරවන නාමය අරූඪ ශබ්ද නම්වේ. උදාහරණ:-සෙල්ලු, තෙල් බූ, මිගුර්, ආදියයි.

පඤ්චවිධ ශබ්ද එකවාක්‍යයක ගැලපෙන පරිදි මෙසේ දත යුතු

ලොකු සුදු සාදන මිනිහා නද්‍යොරිස් නම්.

සුදු අං ඇත්තාවූ දුවන ගොණා හඳයා නම්වේ

මෙහි ලොකු යනු ගුණශබ්දයි, සුදු යනු ද්‍රව්‍ය ශබ්දයි. සාදන යනු ක්‍රියා ශබ්දයි, මිනිහා යනු ජාති ශබ්දයි. නද්‍යෝරිස් යනු සංඥා ශබ්දයි.

සුදු යනු ගුණශබ්දයි, අං යනු ද්‍රව්‍ය ශබ්දයි, දුවන යනු ක්‍රියා ශබ්දයි, ගොණා යනු ජාති ශබ්දයි, හඳයා යනු සංඥා ශබ්දයි.

**සකර්මක හා අකර්මක භේදය.**

ක්‍රියා සැදෙන්නාවූ ධාතු සකර්මක හා අකර්මක යයි ගන දෙකකට බෙදන ලදහ.

යම් ධාතුවකින් සැදෙන ක්‍රියාවක් කර්තෘ සමග යෙදූ විට එහි කර්මයක් ඕනෑවේ නම් හෙවත් කර්මයක් ඇතිබව හැඟේ නම් ඒ ක්‍රියාවෙන් සැදෙන ධාතුව සකර්මක ධාතු ගනයටද; කර්මයක් නොහැඟේ නම් හෙවත් නොකියවේ නම් ඒ ක්‍රියාවෙන් සැදෙන ධාතුව අකර්මකධාතු ගනයටද අයිතිය.

**සකර්මක ධාතු.**

| | | | |
|---|---|---|---|
| කර | (කිරීමෙහි) | මර | (මැරීමෙහි) |
| පිස | (වැසීමෙහි) | ලබ | (ලැබීමෙහි) |
| සුර | (සිරීමෙහි) | සිඳ | (සිඳීමෙහි) |

| | | | |
|---|---|---|---|
| පිස | (පිසීමෙහි) | රක් | (රැකුමෙහි) |
| බඳ | (බැඳීමෙහි) | තන | (තැන්මෙහි) |
| ගණ | (ගිණීමෙහි) | හර | (හැරීමෙහි) |

### අකර්මක ධාතු.

| | | | |
|---|---|---|---|
| ඇති | (වීමෙහි) | සිතා | (සිතාසීමෙහි) |
| සිට් | (සිට්මෙහි) | ගිලි | (ගිලීමෙහි) |
| නිදි | (නිදීමෙහි) | බිය | (බිඃවීමෙහි) |
| රැඳි | (රැඳීමෙහි) | හැඬ | (හැඬීමෙහි) |

සකර්මක ධාතුන්ගෙන් සෑදුනුක්‍රියාවෝ වාක්‍ය සාදන්නා සෙද්‍ර පර්ද්දෙන් කර්තෘ හෝ කර්ම උක්ත කෙරෙත්. අකර්මක ධාතුන්ගෙන් සෑදුනු ක්‍රියා කර්තෘ පමණක් උක්ත කෙරෙත්-ක්‍රියාවෙන් කර්තෘ උක්ත වන කල්හි එය කර්තෘ කාරක ක්‍රියාව යයි කියාද, කර්මය උක්ත වන කල්හි එය කර්ම කාරක ක්‍රියාවයයි කියාද කියනු ලැබේ.

### ක්‍රියාව සම්බන්ධව පවතින කාලතුන හා කාරකතුන

පසුවුන කාලය අතීත කාලයයි. දැන් පවත්නා කාලය වර්තමාන කාලයයි. මතු පැමිණෙන්ට තිබෙන කාලය අනාගත කාලයයි.

එබැවින් තිත්දුකල ක්‍රියාව අතීත කාල ක්‍රියාවයි. නොනිම් ක්‍රියාව වර්තමාන කාල ක්‍රියාවයි. ආරම්භනොකල ක්‍රියාව අනාගතකාල ක්‍රියාවයි.

අන්‍යකාරක, න ශබ්ද කාරක, ම ශබ්ද කාරක කියා ක්‍රියා පදය සම්බන්ධව පවත්නා කාරක තුනක්වේ.

මේ කාරක තුනට ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ, උත්තම පුරුෂ ක්‍රියාද කියති.

අභිමුඛත් නුවූ තමනුත් නූවූ කෙනෙක් කරණ ක්‍රියාව අන්‍යකාරක ක්‍රියායි. තෝ, උඹ, තමුසේ, යනාදි අභිමුඛවූ වකු කරණ ක්‍රියාව නාශබ්ද කාරක ක්‍රියායි. මම අපි යන ශබ්දවලින් ප්‍රකාශවූ වකු කරණ ක්‍රියාව ෂශබ්ද කාරක ක්‍රියායි කියනු ලැබේ.

### කාල කාරකයන් හා යෙදෙන ප්‍රත්‍ය
### ( අග වෙනාස්කරණ අකුරු )
### අන්‍ය කාරකයෙහි.

| | |
|---|---|
| ඒ:-එ-ඉ-ඊ-උ-<br>බ:-ඌය-ඌහු-ඌෂ-ඕ ඌ-උන් | අතීත කාලයෙහිව |
| ඒ:-ඉ-ඕ-ඒ-ආ<br>බ:-අත්-ඉත්-එත්-ඔත්- | වර්තමාන කාලයෙහිවී |
| ඒ:-අන්නේ-එන්නේ-ඔන්නේ-නේ<br>බ:-අන්නෝ-අන්නාහු-නාහු | අනාගත කාලයෙහිවී |

### නාශබ්ද කාරක යෙහි

| | |
|---|---|
| ඒ:-ඉහි-උහි-එහි<br>බ:-ආහු-උහු-ඌහු-උන්හු | අතීත කාලයෙහිවී |
| ඒ:-එහි-ඔහි-අයි-ඉයි-එයි,ඔයි<br>බ:-අහු,ඉහු,එහු ඔහු,අවු,ඉවු,එවු.ඔවු | වර්තමාන කාලයෙහිවී |
| ඒ:-අන්නෙහි,ඉන්නෙහි,එන්නෙහි ඔන්නෙහි-නෙහි<br>බ:-අන්නාහු-ඉන්නාහු-එන්නාහු-ඔන්නාහු-නාහු | අනාගත කාලයෙහිවී |

### මශබ්ද කාරක ශෙෂි

ඒ:-ඉම්-ඉම්-ඉම්-ඉම්-එම්-එම්
බ: අමු-අමෝ-අම්ඝ-අම්ඝු-ඉමු-ඉමෝ
ඉම්ඝු-ඊමු-ඊමො-ඊම්ඝ,උමු-උමෝ
උම්ඝ-උම්ඝු-එමු-එමෝ-එම්ඝ
එමඝු-ඔමු, ඔමෝ-ඔම්ඝ-ඔම්ඝු

අතීත කාල ශෙෂි වේ

ඒ:-අම්-අම්-ඉම්-ඉම්-එම්-ඔම්-ඔම්
බ:-අමු-අමෝ-අම්ඝ-අම්ඝු-ඉමු-ඉ
මෝ-ඉම්ඝ-ඉම්ඝු-එමු-එමෝ
එම්ඝ-එම්ඝු-ඔමු-ඔමෝ-ඔම්ඝ
ඔම්ඝු

වෘතී මාන කාල ශෙෂි වේ

ඒ:-අත්නෙම්-අත්නේම්-ඉත්නෙ
ම්-ඉත්නෙම්-එත්නෙම්-එත්
නෙ ම්-ඔත්නෙම-ඔත්නෙම්
නෙම්, නෙම්
බ:-අත්නෙමු-අත්නමෝ-අත්න
ම්ඝ-අත්නම්ඝු-ඉත්නෙමු-
ඉත්නමෝ-ඉත්නම්ඝ-ඉත්
නම්ඝු-එත්නෙමු-එත්නමෝ
එත්නම්ඝ-එත්නම්ඝු-ඔත්
නෙමු-ඔත්නමෝ-ඔත්නම්ඝ
ඔත්නම්ඝු-නෙමු-නමෝ-නම්
ඝ-නම්ඝු

අනාගත කාල ශෙෂි වේ

### කාලකාරකයන් හා ක්‍රියාපද යොදන පරිදි අන්‍ය කාරක ශෙෂි

ඒ.-ඊයේ වබුවා ගෙය තැනුවේය
බ.-ඊයේවබුවෝ ගෙයතැනුවෝය

අතීත කාල ශෙෂි

ඒ.-වෙලෙන්ද අද බබු දෙසී
බ'-වෙලෙඥ් අද බබුදෙත්

වර්තමාන කාල ශෙෂි වේ

| | |
|---|---|
| ඒ.-මතුමෙත් බෝසත්බුදුවන්නේය<br>ඛ.-මතුගැමුණුතිස්ස දෙදෙන උන්<br>වහන්සේගේ අගසව්වන්නෝය | අනාගත කාලයෙහි වේ |

තශබ්ද කාරකයෙහි

| | |
|---|---|
| ඒ.-තෝ ඊයේ වැඩකෙළෙහිය<br>ඛ.-තොපි ඊයේ වැඩ කළහුය | අතීත කාලයෙහි |
| ඒ.-තෝ අද බත් කසිද?<br>ඛ.-තොපි අද බත් කව්ද? | වර්තමාන කාලයෙහිවේ |
| ඒ.-තෝ හෙට ගමට යන්නෙහිද?<br>ඛ.-තොපි හෙට ගමට යන්නාහුද? | අනාගත කාලයෙහි |

මශබ්ද කාරකයෙහි

| | |
|---|---|
| ඒ.-මම ඊයේ ගෙදර ගියෙමි<br>ඛ.-අපි ඊයේ ගෙදර ගියෙමු | අතීතකාලයෙහි වේ |
| ඒ.-මම අද බණ අසමි<br>ඛ.-අපි අද බණ අසමු | වර්තමාන කාලයෙහිවේ |
| ඒ.-මම හෙට බඩුවිකුණන්නෙමි<br>ඛ.-අපි හෙට බඩුවිකුණන්නෙමු | අනාගතකාලයෙහිවේ |

කාලය සහ කාරකය, පෙණෙන්ට හෙවත් කියවෙන්ට වාක්‍ය යෙදීම යෝග්‍ය නොවේ. හුදු ක්‍රියා පදයේ ඒ දෙක උකත වෙන්ට වාක්‍ය තැනීමකට යුත්තේය. මේ ක්‍රියා පිළිබඳවකර්තෘ කාරකයේ ක්‍රියාව ඒක වචන නම් කර්තෘද ඒක වචන විය යුතුයි. කර්තෘ බහු වචන වුවහොත් වරදයි, කර්මකාරකයෙහි කර්ම ක්‍රියා දෙකද සමානව සිටිය යුතුයි, එසේ නූනොත් ඒද වරදයි.

කර්තෘ, කර්ම, ක්‍රියා සම්බන්ධය

ක්‍රියාව කරණතැනැත්තේ කර්තෘ නම්වේ. කර්තෘගේ ක්‍රියාවෙන් විඳිනු ලබන දෙය කර්ම

නම්වේ. කර්තෘහුගේ කිරීම ක්‍රියා නම් වේ. ඒ ක්‍රියාවෙන් කර්තෘහෝ කර්මය කියනුලබත්. කර්තෘ කියවුනේ නම් කර්මය නොකියවේ. මේ දෙකින් එකක් කියවියයුතු හෙවත් උක්ත විය යුතුයි. උක්ත කර්තෘ සහ උක්ත කර්ම ප්‍රථමා විභක්ති යෙහිද, අනුක්ත කර්තෘ සහ අනුක්ත කර්ම කර්තෘ කර්ම වශයෙන්ද යෙදේ. සිංහල භාෂාවේ බොහෝ ක්‍රියා කර්තෘ උක්ත වන ක්‍රියාවෝ වෙත්. කර්මය කියවෙන ක්‍රියා ඇත්තේ ඉතා ස්වල්පයි. ක්‍රියාවේ ධාතුව බොහෝවිට භාව ක්‍රියාවෙහි යොදා ඊට "ලබ" යන්නක් එක්කොට ත්‍රෙසිකාලික කාරකත්‍රයේ ප්‍රත්‍යයෝ එක්කිරීමෙන් කර්මය කියවෙන්ට ක්‍රියාව කනා ගතහැක. සමහර විට "ලබ" යන්න නොමැතිව ධාතුවේ පණ්කුරු පෙරලා අතීත කාලයෙහිදී ධාතුව අගට "න" කාරකයක් එක්කොටද වර්තමාන අනාගත කාලයන්හිදී "න" කාරයක් එක්නොකොටද, ඉහතකී ප්‍රත්‍යයන් යොදා කර්මය කියවෙන්ට ක්‍රියාව සාදා ගැණීමද කල්හැක.

**කර්තෘ දරණ නාමයන්ගේ අග මෙහි පහත පෙණෙන රූප යෙදෙත්.**

ඒක වචනයේ:-අ-උ-ආ-හු
බහු.වචනයේ:=උන්-න,අන=අන්,න්,නන්-වෙත්
කර්මයට එම කර්තෘ ප්‍රත්‍යයන් සමග "ට" "නට" යන ප්‍රත්‍ය දෙකක්ද වෙත්.

‡"සමග" "සහ" "හා" "විසින්"යන නිපාත සමග යෙදෙන නාම බොහෝවිට කර්තෘද

විනා, මිස, මෙන්, යන නිපාත සමග යෙදෙන නාම බොහෝ විට කර්මද ගනී. විසින් යන නිපාතය කර්තෘ ගතවන ප්‍රධාන ලක්ෂණයක් ලෙස සැලකිය යුතුයි.

ක්‍රියාවෙන් කර්තෘ උක්තවන උදාහරණ.

භික්ෂු තෙම ගමට එයි. තා කුමරුන් වැන්දෙහි මම කුඹුර කොටමි. පණ්ඩිතයෝ ගුණ කෙරෙති අපි පොකුණ බිඳිමු. තොපි බණ අසන්න හුද රජහු යුධ කෙරෙත්, බල්ලෝ පොරකත්,

මෙහි ඉරිදෙක ලකුණු කොට ඇති නාම උක්ත කර්තෘ ප්‍රථමාවෙහිද, ඉරලකුණු කොට ඇති නාම කර්මයෙහිද යෙදී තිබේ.

ක්‍රියාවෙන් කර්ම උක්ත වන උදාහරණ

වඩුවා ගෙය සාදනු ලැබීය නුඹ මා මරණු ලැබෙහිය, සතුරන් මම නසන ලද්දෙමි. බළලුන් මීයෝ කන ලද්දුය, තොපි දෙවියන් මවනු ලද්දහුය. නෑයන් අපි දකිනු ලැබෙමු. බඹරුන් මී බඳිනු ලැබේ, ගුරුවරයන් ශිෂ්‍යයෝ පුහුණු කරණ ලද්දේය.

මෙහි ඉරි දෙක ලකුණු කොට ඇති නාම උක්ත කර්ම ප්‍රථමාවෙහිද ඉර ලකුණු කොට ඇති නාම කර්තෘදවේ.

නිපාත සමග යෙදුන කර්තෘ දක්වන උදාහරණ:- නුඹ ඔහු සමග ගෙදර යන්නෙහිද? ඇමතියා සහ රජ මිතුව විසුවේය. බුදුන් හා කවරෙක් සමද? නුඹ මා විසින් මරණු ලැබෙහිය.

**නිපාත සමග යෙදුන සාමීප්‍ය දක්වන උදාහරණ**

මා විනා මේ පැනය අනික්කවරෙක් දනීද? මගේ බඩු මිස වෙන බඩු නොගණිමි. පිරිමි ලමයි මෙන් ගැණුලමෝ ඉගෙණ ගත යුත්තෝය.

—නිමි—

## දැනගත යුතු ප්‍රශ්ණ

1 ව්‍යාකරණය යනු කුමක්ද?
2 අකුරුවලින් ඇති ප්‍රයෝජනය මොකද?
3 පදය, වාක්‍යය මෙහි ඇති වෙනස ලියනු
4 හෝඩිය කියන්නේ කුමකටද? දැන් ව්‍යවහාර කරණ හෝඩිය කෙසේ සැදුනේද?
5 ව්‍යවහාර හෝඩියේ අක්ෂර ලියනු.
6 ස්වර කෙසේවූ අකුරුද? ස්වරවලට තවත් ව්‍යවහාර නම් ලියනු.
7 හ්‍රස්ව විස්තරකර ඒ වෙන්වශයෙන් ලියනු.
8 රාජාධි රාජ, මෙහි ලඝු ගුරු අදිනු
9 ස්වර වෙනුවට පාවිච්චිකරණ ලකුණු තුනක් ලියනු
10 මාත්‍රාව විස්තරකරනු.
11 ව්‍යජන කෙසේවූ අකුරුද?
12 ව්‍යජන කීයකට බෙදන ලදද, ඒ කවරේද
13 අකුරු උපදවන කරණ මොනවාද?
14 වර්ගීයන්ගේ මූලකුරු මොනවාද?
15 වර්ගාන්තාක්ෂර ලියා උපදින තැන් ලියනු,
16 ඝෝෂ, අඝෝෂ, අන්තඃස්ථ, ඌෂ්ම යන මේවා විස්තරකර උදාහරණ ලියනු.

17 උගුරෙන් උපදින අක්ෂර ලියනු.

18 අනුනාසිකාක්ෂර, ඕෂ්ඨජාක්ෂර වෙන් වශයෙන් ලියනු.

19 අනුස්වාරය, විසර්ජනීය විස්තර කරනු.

20 ස්වර ආරූඪවූ ගාත්‍රාක්ෂර පහක් ලියනු.

21 ජූයශ්‍රී සිඩානතය, පුංචිප්පුහාමි, මෙහි ස්වර ව්‍යඤ්ජන වෙන්කරනු.

22 සංයෝග, ප්ලුත, මූර්ධජ, මේ මොනවාද?

23 සිංහල භාෂාව මිශ්‍ර වූයේ කවර භාෂා සමගද? අමිශ්‍ර සිංහල පාඨයක් ලියනු.

24 ශුද්ධ සිංහලෙන් කර තිබෙන පොත් මොනවාද?

25 සංස්කෘත හා පාලි භාෂාව මිශ්‍රවීමට හේතුව මොකද?

26 චතුර්විධ පද ලියා ඒ එකි නෙකට උදාහරණ දෙනු.

27 පදඝතර අනතගීත වාක්‍යයක් ලියනු.

28 ලමෝ අකුරු උගණිද්ද? මෙහි පද වෙන් කර ඒ පද අසවල් පදයයි ලියනු.

29 අර්ථ අලංකාර කරණ උපසර්ග ලියනු.

30 සර්ව නාම, නාම නාම, මේ විස්තර කරනු.

31 මූල, අග නිපාත ඇති වාක්‍යයක්ලියනු.

32 ලිඞ්ගය විස්තරකර ස්ත්‍රීලිඞ්ග පද ලියනු.

33 ගොනා, රජ, ඇත්, දස්, මහනා, වලස්, ශොර මේ ශබ්දයන්ගේ ස්ත්‍රීලිඞ්ග ශබ්ද ලියනු.

34 එකබස විස්තර කර එකබසේ ශබ්ද බුහුබස් වන ප්‍රත්‍ය දක්වනු.

35 බහුවචන පද පහක් ලියා එහි ඒකවචනත් එකනම ලියනු.

36 ලිඞ්ග සහ සඞ්ඛ්‍යා භෙදය ප්‍රකටනැති පද මොනවාද?

37 පංචවිධ ශබ්දයෝ කවරහුද?

38 සංඥා ශබ්දය, ගුණශබ්දය, ජාතිශබ්දය, යන මෙයින් ඇතුලත් වාක්‍යයක් ලියනු.

39 ගුණ ආදියට ආධාරවූ ශබ්දය කුමක්ද?

40 අකර්මක ධාතු තුනක් ලියනු.

41 යම්ධාතුවක් සකර්මකද අකර්මකදැයි හොයන්නේ කෙලෙසද?

42 අතීත කාලය සහ උත්තම පුරුෂය විස්තර කරනු.

43 ප්‍රථම පුරුෂයට අයිති අතීත කාල ප්‍රත්‍යයෝ කවරහුද?

44 නැනුවේය, මෙය කුමන කාරක මොන කාල ක්‍රියාවක්ද?

45 ධාතුව, ප්‍රත්‍ය දෙක විස්තර කර වූයෙම්, බොති, නිදන්නේය, මේ ක්‍රියා පදයන්ගේ ධාතු ප්‍රත්‍යයන් වෙන්කොට දක්වනු.

46 ආඛ්‍යාත පදය විස්තර කොට වර්තමාන කාල ආඛ්‍යාත පද දෙකක් ලියනු.

47 කර්තෘ උක්ත නම් කර්මය අනුක්තයි මෙහි සත්‍යතාව ඔප්පු කරනු.

48 කර්තෘ කාරක ක්‍රියා වලින් කර්ම කාරක ක්‍රියා සාදාගන්නා හැටිලියනු.

49 කර්තෘ දරණ නාමයට උදාහරණ දක්වනු.

50 කර්මය විස්තර කර එම් නාමයේ අග යෙදෙන ප්‍රත්‍ය ලියනු.

# ශුද්ධි පත්‍රය.

| පිට | පෙළ | වරද | නිවරද |
|---|---|---|---|
| 1 | 1 | ව්‍යකරණ | ව්‍යාකරණ |
| 1 | 10 | සංඥී | සඥී |
| 1 | 11 | විභකති | විභක්ති |
| 2 | 18 | ශබද | ශබ්ද |
| 6 | 14 | ඍජු | ඎජු |
| 6 | 16 | සෟෘ | සෲ |
| 6 | 17 | තෘ | තෟ |
| 6 | 18 | ඥෟ | ඣෟ |
| 7 | 1 | ත්‍ර | ත්‍රා |
| 7 | 2 | පදිරි | පරිදි |
| 7 | 3 | දුටුගැමුණු | දුට්ඨගැමුණු |
| 8 | 14 | ක්+ව | ත්+ව |
| 8 | 26 | රෙළු | රෙළු |
| 10 | 9 | අඛයාත | අඛ්‍යාත |
| 10 | 28 | අධා | ආධාර |
| 11 | 25 | වක්‍ය | වාක්‍ය |
| 12 | 2 | නානාර්ථ | නානාර්ථ |
| 12 | 17 | අනුරූප | අනුරූප |
| 14 | 15 | භික්ෂුනී | භික්ෂුණී |
| 15 | 1 | සංඛ්‍යා | සඞ්ඛ්‍ය |
| 15 | 24 | ප්‍රතිකෘය | ප්‍රකෘතිය |
| සමහර | තැන්වල | කර්තෘ | කතෘ |



